# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**07 ශ්‍රේණිය** | **විද්‍යාව** | **ඒකකය 1 - ශාක විවිධත්වය**

## A කොටස

**සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) භූගත කඳක් දරන ශාකයකි.
1) බතල 2) මඤ්ඤොක්කා 3) ඉඟුරු 4) කඩල

02) මුදුන් මූල පද්ධතියක් සහිත ශාකයකි,
1) පොල් 2) දෙල් 3) ඉරිඟු 4) වී

03) අපුෂ්ප ශාකයකි,
1) අඹ 2) මඩු 3) කිතුල් 4) උණ

04) කයිරු මුල් හා කරු මුල් පිළිවෙලින් අඩංගු ශාක වන්නේ,
1) ඕකිඩ්, රම්පේ 2) වැටකෙයියා, නුග 3) කැරට්, කිරල 4) නුග, රම්පේ

05) වරා බීජය ව්‍යාප්ත වන්නේ,
1) ජලය මගිනි 2) සතුන් මගිනි 3) ස්ඵෝටනයෙනි 4) සුළඟ මගිනි

06) වාතයේ ඇති ජලවාෂ්ප අවශෝෂණය කරනුයේ,
1) වායව මුල් මගිනි 2) වායුධර මුල් මගිනි 3) කරු මුල් මගිනි 4) තන්තු මුල් මගිනි

07) අතු බෙදුනු කඳක් සහිත ශාකයකි,
1) වී 2) පොල් 3) පේර 4) උණ

08) වායව කඳේ ආහාර තැන්පත් කර ඇත.
1) ලූණු 2) අර්තාපල් 3) උක් 4) වද

## B කොටස

♣ **හිස්තැනට ගැලපෙන තනි වචනය හිස්තැන මත ලියන්න.**

1) බේදුරු, මඩු, මීවන, ෆයිනස් ඇතුලත් පොදු කාණ්ඩය ....................................................... ලෙස හැඳින්වේ.

2) ගම්මාලු, හොර, වරා, වැනි ශාක ....................................................... මගින් ව්‍යාප්ත වේ.

3) කොස්, අඹ, කරපිංචා වැනි ශාක වල පත්‍රවල දක්නට ඇත්තේ ........................................... නාරටි වින්‍යාසයයි.

4) භෞමික ශාකවල පොළව යට ඇති භූගත කොටස ............................................... පද්ධතිය ලෙස හැඳින්වේ.

5) වැටකෙයියා ශාකයට ශක්තිය ලබාදීමට සැකසී ඇති මුල් වර්ගය ........................................ මුල් ලෙස හැඳින්වේ.

6) බෙලි, රටදෙල්, සමන්පිච්ච වැනි ශාක බෝවීම සිදුවන්නේ .............................................. ප්‍රජනන ක්‍රමයෙනි.

7) කලංකය, කිලය, ඩිම්බකෝෂය යන කොටස් පුෂ්පයක ...................................................... ලෙස හැඳින්වේ.

8) රනිල ශාකවල මුලගැටිති තුළ ජීවත් වන්නේ ........................................... ලෙස හඳුන්වන ක්ෂුද්‍ර ජීවීන් ය.

9) මෑ බීජයක ඇතුළත ඇති පියළි හඳුන්වන්නේ ................................................ ලෙසය.

## C කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) ශාකයක සුවිශේෂී කාර්යයක් ශාකපත්‍ර මගින් ඉටුවේ.

a) ශාක පත්‍රයක ප්‍රධාන කාර්යය කුමක්ද ?

b) සංයුක්ත පත්‍රයක් යන්න හඳුන්වන්න.

c) සරල පත්‍රයක රූප සටහනක් ඇඳ එහි ප්‍රධාන කොටස් නම් කරන්න.

2) මුල් හා කඳ යනු ශාකයක ඇති ප්‍රධානතම කොටස් 2 කි.

a) නිදිකුම්බා ශාකයේ ඇති මුල්වලින් කෙරෙන විශේෂ කාර්යය කුමක්ද ?

b) භූගත කඳන් යනු මොනවාද ?

c) පහත දැක්වෙන විශේෂ කාර්යයන් ඉටුකරන ශාක 2 බැගින් ලියන්න.

i) ආහාර සංචිත කරන මුල් :- ......................................................................................

ii) කඳ ඉහළට නැගීමට ආධාර කරන මුල් :- ..............................................................................

iii) වර්ධක ප්‍රජනනය සිදුකරන මුල් :- ..........................................................................................

3) මල් පිපෙන හා මල් නොපිපෙන ලෙස ශාක ප්‍රධාන කාණ්ඩ 2 කි.

a) සපුෂ්ප හා අපුෂ්ප ශාක 2 බැගින් ලියන්න.

b) සපුෂ්ප ශාකයක ප්‍රධාන පද්ධති දෙක නම් කරන්න.

c) මුල් වල ප්‍රධාන කාර්යයන් 2 ක් ලියන්න.

4) පුෂ්ප යනු ශාකයක ලිංගික ප්‍රජනනය සඳහා වැදගත් වන කොටසයි.

a) පුමාංගයට හා ජායාංගයට අයත් ප්‍රධාන කොටස් නම් කරන්න.

b) කජු, වරා, කුඩලු වැනි ශාකවල බීජ ව්‍යාප්තියට ඇති විශේෂ හැඩගැසීම් ලියන්න.

c) ඒකබීජ පත්‍රී හා ද්විබීජ පත්‍රී යන පදවල අර්ථය ලියන්න.

සැකසුම - කේ. වී. සී. ප්‍රියදර්ශනී මිය